Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව අනුමාන පෙරහුරු පරීක්ෂණය

2-1

# වයඹ පළාත

EXAMINATIONS FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES


පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය


විභාග අංකය : ..................................


## I පත්‍රය


පැය එකයි.

01. කොටුව තුළ ඇති රූපයට සමාන වන සේ ඇඳ ඇති චිත්‍රය කුමක් ද?





1.



2.


3.


02. කොටුව තුළ දැක්වෙන රූපයට වඩාත් සමීප සම්බන්ධතාවක් දක්වන රූපය කුමක් ද?




1.


2.


3.


03. මෙම රූපය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.




1. මෙහි සමචතුරස්‍ර, ත්‍රිකෝණ සහ සෘජුකෝණාස්‍ර සමාන ප්‍රමාණ බැගින් ඇත.
2. මෙහි සමචතුරස්‍ර හා සෘජුකෝණාස්‍රවලට වඩා ත්‍රිකෝණ ඇත.
3. මෙහි ත්‍රිකෝණ වල හා සමචතුරස්‍රවල එකතුවට සමචතුරස්‍ර හා සෘජුකෝණාවල එකතුව සමාන වේ.

04. පාසලක සීනුව මිනිත්තු 40 කට වරක් නාද වෙයි. එය මුල් වරට නාද වූයේ පෙ.ව. 7.50 ට නම් එය තුන්වන හා පස්වන වරට නාද වන වේලාවන් පිළිවෙළින්,

1. පෙ.ව. 9.10, පෙ.ව. 10.30
2. පෙ.ව. 8.30, පෙ.ව. 9.50
3. පෙ.ව. 11.10, පෙ.ව. 9.10


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

05. 



දී ඇති රූපයෙහි වටේ දිග කීයද?

1. 20cm
2. 25cm
3. 30cm

- අංක 06 හා 07 ප්‍රශ්නවල රටාව අනුව ඊළඟට ආ යුතු රූපය තෝරන්න.

06. 

1. 2. 3.


07. 


1. 2. 3. 

08. පහත දී ඇති වාක්‍යවලින් නිවැරදිව ලියා ඇති වාක්‍යය තෝරන්න.

1. කිසිවෙක් මහ හඬින් අඬද්දී ඇතැමෙක් නිසොල්මන්ව සිටියේ ය.
2. කිසිවෙක් මහ හඬින් අඬද්දී ඇතැමෙක් නිසොල්මන්ව සිටියෝ ය.
3. කිසිවෙක් මහ හඬින් අඬද්දී ඇතැමෙක් නිසොල්මන්ව සිටින ලදී.

09. කොටුව තුළ දී ඇති කාණ්ඩයට ඇතුළත් කිරීමට වඩාත් ගැළපෙන රූපය තෝරන්න.



1. 2. 3. 

10. සමචතුරස්‍ර එළවලු කොටුවක පැත්තක දිග 30cm කි. එහි මායිම දිගේ මීටර 5 න් 5 ට කම්බි කණු සිටුවා ඇත. එසේ සිටුවා ඇති කම්බි කණු ගණන කීයද?

1. 24
2. 20
3. 16

11. රටාව අනුව හිස්තැනට ගැළපෙන ඩොමිනෝ පත කුමක් ද?

| 40 | 3 × 4 |
|---|---|

| 12 | 9 × 3 |
|---|---|

| 27 | 6 × 4 |
|---|---|

.................?.................

| 18 | 8 × 4 |
|---|---|

1.

| 24 | 8 × 3 |
|---|---|

2.

| 18 | 9 × 2 |
|---|---|

3.

| 24 | 6 × 3 |
|---|---|

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- පහත දැක්වෙන සටහන ඇසුරෙන් 12 සහ 13 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| අලිපේර 2 දිවුල් 3 | ← | රු. 190.00 | | අලිපේර 3 දිවුල් 4 | ← | රු. 320.00 |
|---|---|---|---|---|---|---|

12. අලිපේර 1 ක් සහ දිවුල් ගෙඩි 1 ක මිල සොයන්න.
 1. රු. 120.00  2. රු. 130.00  3. රු. 140.00

13. අලිපේර 5 ක හා දිවුල් ගෙඩි 7 ක මිල සොයන්න.
 1. රු. 500.00  2. රු. 510.00  3. රු. 520.00


14. මගේ සාක්කුවේ වර්ග තුනකින් කාසි 9 ක් තිබේ. ඒවායේ එකතුව රු. 24 කි. මගේ සාක්කුවේ තිබෙන කාසි මොනවා ද?
 1. රුපියල් පහේ කාසි 2 යි. රුපියල් දෙකේ කාසි 4 යි. රුපියලේ කාසි 3 යි.
 2. රුපියල් පහේ කාසි 3 යි. රුපියල් දෙකේ කාසි 3 යි. රුපියලේ කාසි 3 යි.
 3. රුපියල් පහේ කාසි 3 යි. රුපියල් දෙකේ කාසි 2 යි. රුපියලේ කාසි 4 යි.

15. රථ ගාලක මෝටර් රථ 15 ක්, ත්‍රීවිල් රථ 7 ක් සහ යතුරු පැදි 30 ක් නවතා ඇත. එම වාහනවල මුළු රෝද ගණන කීයද?
 1. 140  2. 150  3. 141


16. යතුරු පැදියක් පැය 3 මිනිත්තු 15 කදී 195km ගමන් කරයි. එහි වේගය පැයට කිලෝමීටර කීයද?
 1. 60km  2. 40km  3. 50km

17. | 90 ÷ 15 | = 6 කොටුකර ඇති ගණිත කර්මයේ පිළිතුරට සමාන අගයක් දිය හැකි පිළිතුර තෝරන්න.
 1. 3 × 3  2. 3 × 2  3. 3 × 4

- ප්‍රශ්න අංක 18 හා 19 ප්‍රශ්නවල සංඛ්‍යා රටාවලට ගැළපෙන පිළිතුරු තෝරන්න.

18.


 1. 25
 2. 30
 3. 35

19.


 1. 10
 2. 12
 3. 14


20. මගේ දැන් වයස අවුරුදු 11 කි. එය මගේ මවගේ වයසින් හතරෙන් එකකි. තව අවුරුදු 11 ක් ගිය විට මවගේ වයස කොපමණ ද?
 1. අවුරුදු 44  2. අවුරුදු 55  3. අවුරුදු 48

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

21. වරකට තේ හැඳි දෙක බැගින් දිනකට තුන් වරක් බෙහෙත් බොන චමත් දින තුනකදී බොන බෙහෙත් ප්‍රමාණය වන්නේ,

1. 18ml 2. 90ml 3. 6ml

- පහත දක්වා ඇති රූපය බලා අංක 22 සිට 23 ප්‍රශ්නවලට අදාළ පිළිතුර තෝරන්න.





22. වෘත්තයට පමණක් අයත් අංකය තෝරන්න.

1. 4 2. 7 3. 2

23. මෙම රූපයේ හැඩතල තුනට ම අයිති අංකය කුමක් ද?

1. 3 2. 5 3. 6

24. පලතුරු සඳහා කැමති සිසුන් පිළිබඳ තොරතුරු පහත සටහනේ දැක්වේ. ඒ අනුව මිදි, අඹ, ඇපල්, දොඩම් සංඛ්‍යාව පිළිවෙළින් නිවැරදිව ලියා ඇති පිළිතුර වන්නේ,





1. 50, 25, 15, 25
2. 50, 50, 25, 75
3. 45, 30, 15, 30

25. ඉහත සටහනට අනුව ඇපල්වලට කැමති සිසුන් සංඛ්‍යාව 20 ක් නම්, මිදිවලට කැමති සිසුන් සංඛ්‍යාව කොපමණ ද?

1. 80
2. 60
3. 40

- පහත දක්වා ඇති කුඩා කොටුවක පැත්තක දිග හා පළල 10cm බැගින් යැයි සිතා 26 - 27 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.




26. කවිඳු මෙම ජාලය තුළ 100m ගමන් කරයි. ඔහු ගමන් කර ඇත්තේ,

1. A සිට D හරහා E වෙත
2. A සිට B හරහා C වෙත
3. D සිට C හරහා F වෙත

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

27. මෙම ජාලය තුළ කසුන් A සිට B, G හරහා H වෙත ගමන් කළේ නම් ඔහු ගමන් කළ දුර කොපමණ ද?

1. 120m
2. 130m
3. 140m

28. සමිතියක තිබූ අරමුදලින් 1/2 ක් උපකරණ අලුත්වැඩියාව සඳහා වෙන් කර ඉතිරි මුදලින් 1/2 ක් ගොඩනැගිලි නඩත්තුවට වියදම් කළ පසු රු. 20,000 ක් ඉතිරි වූයේ නම්, සමිතියේ තිබූ අරමුදල කීයද?

1. රු. 80,000
2. රු. 100, 000
3. රු. 120,000

• ○ × △ = □ සහ □ = ○ + ○ + ○ වේ.


29. △ මගින් දැක්වෙන සංඛ්‍යාව කුමක් ද?

1. 2
2. 3
3. 6

30. 3 × △ = ○ සහ 12 × □ = ○ ක් වේ. △, □ මෙන් කී ගුණයක් ද?

1. දෙගුණයකි.
2. තුන් ගුණයකි.
3. හතර ගුණයකි.

31. පහත දැක්වෙන පරිදි මුල් රූපයේ කඩදාසි කැල්ලක් හතරට නවා එය සිදුරු කිහිපයක් විද ඇති ආකාරය දැක්වේ. එම කඩදාසි කැබැල්ල නැවත දිග හරින විට දැකිය හැකි රූපය තෝරන්න.



1. 2. 3.

32. 2021 වර්ෂය අයත් සියවස හා දශකය වන්නේ,

1. 21 වන සියවස 1 වන දශකයට
2. 21 වන සියවස 3 වන දශකයට
3. 20 වන සියවස 3 වන දශකයට

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- 2021 වර්ෂයේ ජනවාරි 01 දින සිකුරාදා දිනයකි. ඒ අනුව 33 හා 34 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

33. 2021 වර්ෂයේ මාර්තු 01 වනදා දවස කවදා ද?
   1. අඟහරුවාදා
   2. බදාදා
   3. සඳුදා

34. 2021 වර්ෂයේ සිකුරාදා දින කීයක් තිබේ ද?
   1. 52
   2. 53
   3. 54


35. පහත සම්බන්ධය බලන්න.


   සීනි 2kg ක මිල = කිරි පිටි 1kg මිල


   කිරිපිටි 3kg ක මිල = තේ කුඩු 1kg ක මිල

   සීනි 1kg ක් රුපියල් 80 ක් නම්, තේ කුඩු 500g ක මිල කීයද?
   1. රුපියල් 80
   2. රුපියල් 120
   3. රුපියල් 240

36. A, B මෙන් දෙගුණයකි. A සහ B හි එකතුව C ට සමාන වේ. මෙම තොරතුරු ප්‍රමාණාත්මකව දක්වා ඇති සටහන තෝරන්න.


1. 


2. 


3. 


37. අවුරුද්දේ හත්වන මාසයට පෙර මාසයත්, පසු මාසයත් පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?
   1. ජූනි සහ අගෝස්තු
   2. මැයි සහ ජූලි
   3. ජූලි සහ සැප්තැම්බර්


38. පහත දැක්වෙන්නේ එකම ඝනකයක විවිධ පැතිය. ඒ අනුව Z අකුරට විරුද්ධ පැත්තේ ඇත්තේ,




1. B
2. A
3. W

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- සටහන බලා අංක 39 හා 40 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




39. පාසලේ සිටින අයෙක් එහි සිට නිවස හා පන්සල පසු කොට නගරය හරහා තැපැල් කාර්යාලය වෙත යා යුතු දුර කොපමණ ද?

   1. 594m
   2. 610m
   3. 692m

40. කාර්යාලයේ සිට තැපැල් කාර්යාලයට යා යුතු කෙටි ම මාර්ගයේ දුර ප්‍රමාණය කොපමණ ද?

   1. 546m
   2. 490m
   3. 626m

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව අනුමාන පෙරහුරු පරීක්ෂණය

2-2

# වයඹ පළාත

EXAMINATIONS FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES

පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

විභාග අංකය : ..............................

## II පත්‍රය

පැය එකයි මිනිත්තු 15

---

- **පහත සඳහන් ඡේදය හොඳින් කියවන්න.**

එක අතකින් මුහුදටත්, අනෙක් අතින් විශාල නදියටත්, මැදි වූ අපේ ගම් පෙදෙස කුඩා බිම් තීරයකි. පොල් ගසින් ද, දෙල් ගසින් ද සෙවණ වූ අත්තන, කිඩාරම්, බලුනගුට, කහඹිලියා, බුරුල්ල, කිරිල්ල, ගඳපාන යන ආදියෙන් හෙවුණු කැලෑ රොදවල් බහුල බිම් පෙදෙස් හැර අප සිත්ගත් සුදු වැලි තලා ඇති වන රොදක් ද එහි වී ය. කජු, මාදන්, අඹ යන ආදී ගස්වලට වැඩි විශාල වෘක්ෂයන් නොවූව ද, නොයෙක් වර්ගයේ පක්ෂීන් ද, හාවුන් ද, ලෙහෙනුන් ද, සර්පයන් ද, මුගටියන් ද, උගුඩුවන් ද, වල් මීයන් ද වාසය කරන ගනව වැඩුණු ඇපල පඳුරු එරමිණියා සහ ගඳපාන අකුල් බෝවිටියා ගොමු එහි බහුල විය.

1. ඉහත ඡේදය ඇසුරින් පමණක් පිළිතුරු සපයන්න.

   i. ගම් පෙදෙස කුඩා බිම් තීරයක් වී ඇත්තේ කුමක් නිසා ද? ..............................

   ii. කැලෑ රෝදවල තිබුණු ශාක තුනක් නම් කරන්න.

   ..............................

   iii. වනයේ සිටි සතුන් වර්ග 2 ක් නම් කරන්න. ..............................

   iv. මෙහි සඳහන් අයගේ සිත්ගත් ස්ථානය කුමක් ද? ..............................

   v. ඡේදයේ සඳහන් පාපිලි දෙකක් පමණක් යෙදුණු වචනයක් ලියන්න. ..............................

   vi. 'විශාල' යන්නට විරුද්ධාර්ථ පදය තෝරා ලියන්න. ..............................

2. දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

   i. හෙටට/ නොදමන්න/ අද/ කල්/ දේ/ යුතු/ කළ

   ..............................

   ii. පුවරුවේ/ කියවීමට/ පුරුදු/ නිර්මාණ/ දෑ/ ඇති/ වෙමු

   ..............................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

3. පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තිත් ඉරි මත ලියන්න.

i. තීරණ ගැනීමේ දී බුද්ධිමත් ලෙස කටයුතු නොකර නුසුදුසු තීරණ ගැනීම.

..............................................................................................................................

ii. අනුන් රවටන්නට ගොස් තමන් රැවටීම.

..............................................................................................................................

4. පහත සඳහන් අර්ථයට ගැළපෙන ඉඟි වැකිය ලියන්න.

i. වගකීමෙන් බේරීම.

..............................................................................................................................

ii. රවටනු පිණිස වර්ණනා කිරීම.

..............................................................................................................................

5. ගැළපෙන යුගල පදය ලියන්න.

i. වාද .............................................  ii. විහිළු .............................................

6. පහත සඳහන් එක් එක් වගන්තිවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

i. නංගි සහ අක්කා මිදුලට ගියා ය. (   )

ii. ඔවුහු මිහිරි සංගීත නාදයක් මතු කළහ. (   )

iii. ගුරුතුමා උදෑසන ම පාසලට ආවා ය. (   )

iv. පබෝධි, අරිත සහ සිනෙත් අන් අයට උදවු කළහ. (   )

v. අපි සාර්ථකව අධ්‍යාපනය ලබමු. (   )

7. ගැළපෙන විරාම ලක්ෂණ යොදන්න.

i. ගුරුවරිය අපේ ලංකාව ගීතය ගායනා කළා ය

ii. අනේ අනේ ඔහොම වැරදි වැඩ කරන්න හොඳ නැහැ

8. හිස්තැනට ගැළපෙන නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය වරහන තුළින් තෝරා ලියන්න.

i. අපි ඩෙංගු ........................ කැපවෙමු. (මර්ධනයට/ මර්දනයට/ මර්ධණයට)

ii. මම වෛද්‍ය ........................ ගියෙමි. (මධ්‍යස්ථානයට/ මද්‍යස්තානයට/ මද්‍යස්ථානයට)


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


9. පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

i. අයියා පොතක් කියවයි. ..............................

ii. නංගී ලස්සන නැටුමක් නටයි. ..............................

10. පහත දී ඇති රූප සඳහා ඉංග්‍රීසි භාෂාවේ යෙදෙන වචනය ඉංග්‍රීසි අකුරුවලින් ලියන්න.

i.  ..............................

ii.  ..............................

11. පහත ඉංග්‍රීසි වාක්‍යයේ අර්ථය සිංහලෙන් ලියන්න.

i. I have ten fingers. - ..............................

12. පහත වාක්‍යය ඉංග්‍රීසි භාෂාවෙන් කියන ආකාරය ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.

i. ඔබේ වයස කීයද? - ..............................

ii. මට බඩගිනි - ..............................

13. පහත සඳහන් දෙමළ වචනවල සිංහල තේරුම ලියන්න.


i. පුදන් කිළමෙ - .............................. ii. සන්දෙ - ..............................

14. පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.


i. පැන්සල තිබෙනවා. - ..............................

ii. මගේ දෙමළ පොත කොහෙ ද? - ..............................


15. පිළිතුරු ගණක රාමුවෙහි නිරූපණය කරන්න.





+




=




16. ලබා දී ඇති ඝනවස්තුව බලන්න.



i. මෙහි ඇති පෘෂ්ඨ ගණන කීයද? ..............................

ii. වක්‍ර දාර ගණන කීයද? ..............................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

17. ගොවිපළක සිටින එළුවන්ගේ සහ තාරාවන්ගේ පාද-සංඛ්‍යාව 348 කි. ගොවිපොළේ තාරාවන් 82 ක් සිටී නම්, එහි සිටින එළුවන් සංඛ්‍යාව කොපමණ ද?


.................................................

18.

| | | |
|---|---|---|
| ඇපල් 5 + අඹ 3 | → | රුපියල් 190 |
| ඇපල් 4 + අඹ 3 | → | රුපියල් 170 |

ඉහත සටහනට අනුව ඇපල් ගෙඩියක මිල කීයද? .................................................

19. භාජනයක ජලය 4*l* 500m*l* ඇත. එයට තවත් ජලය 3*l* 75m*l* දමන ලදි.
දැන් එහි ඇති ජලය ප්‍රමාණය කොපමණ ද ? .................................................

20. 

මෙම ඔරලෝසුවේ දැක්වෙන්නේ පස්වරු වේලාවකි.


i. තවත් පැයකට පසු වේලාව කීයද? .................................................

ii. මෙම ඔරලෝසුවේ සඳහන් වේලාව සම්මත ක්‍රමයට ලියන්න.

.................................................

21. පැන්සල් පෙට්ටි 525 බැගින් පාසල් 35 කට පැන්සල් පෙට්ටි බෙදා දෙන ලදි. බෙදා දෙන ලද පැන්සල් පෙට්ටි ගණන කීයද?

.................................................

22. 


i. අඳුරු කර ඇති ප්‍රමාණය මුළු රූපයෙන් කවර භාගයක් ද?

.................................................

ii. අඳුරු නොකළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

.................................................

23. A නගරයේ සිට C නගරයට ඇති දුර 125km කි.
B නගරයේ සිට C නගරයට ඇති දුර 29km කි.
A නගරයේ සිට B නගරයට ඇති දුර කොපමණ ද?





.................................

24. දී ඇති සංඛ්‍යා රටාවේ ඊළඟ සංඛ්‍යා දෙක ලියන්න.

i. 32, 16, 8, 4, ............. , ..............

25. පහත රූපයේ ඇති මල් ගණන රෝම සංඛ්‍යාංකයෙන් ලියන්න.




.........................................

26. පොල් ගෙඩි 973 ක් සමාන ගොඩවල් හතකට දමන ලදි.
එක් ගොඩක ඇති පොල් ගෙඩි ගණන කීයද? .................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

27. ප්‍රස්තාරයේ දැක්වෙන තොරතුරු අනුව වගුව සම්පූර්ණ කරන්න. වගුවේ දැක්වෙන තොරතුරු අනුව ප්‍රස්තාරය සම්පූර්ණ කරන්න.

| පලතුරු වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| ඇපල් | ............. |
| දිවුල් | 20 |
| කොමඩු | 24 |
| කෙසෙල් | 6 |




28. බයිසිකල්කරුවෙකුට 45km දුරක් යාමට පැය 3 ක කාලයක් ගත වේ.
15km දුරක් යාමට කොපමණ කාලයක් ගතවේ ද? ..............................................

29. පිට්ටනියක හරි කෙළින් එක ළඟ කණු අතර පරතරය 6m ක් වන සේ කණු 9 ක් සිටුවා ඇත. පළමු කණුවේ සිට අවසාන කණුව දක්වා ඇති දුර කොපමණ ද? ..........................................

- **අංක 30 සිට 59 දක්වා එක් එක් ප්‍රශ්නයට ලබා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

30. සූර්ය නමස්කාරය ක්‍රියාකාරකම කළ යුත්තේ,
(1) සතිපතා ය. (2) දිනපතා ය. (3) මාසපතා ය.

31. මක්කම වන්දනාවේ යෙදීම, අල්හා දෙවියන් සිහිකර ආහාර බෙදා ගැනීම සිදු කරන්නේ,
(1) කතෝලික ආගම අදහන්නන්
(2) ඉස්ලාම් ආගම අදහන්නන්
(3) බෞද්ධ ආගම අදහන්නන්

32. "ස්වයංපෝෂිත රටක ඉර හඳ පවතින තෙක් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාව වැජඹේවා" මෙය රාජ්‍ය ලාංඡනයේ,
(1) සමස්ත අංගවලින් පිළිබිඹු වන අදහසයි.
(2) ධර්ම චක්‍රයෙන් පිළිබිඹු වන අදහසයි.
(3) ඉර හා හඳෙන් පිළිබිඹු වන අදහසයි.

33. කඳ අරටුවක් නොමැති ශාකයකි.
(1) උක් (2) කොස් (3) බුරුත

34. ශ්‍රී ලංකාවේ ඒක දේශික ශාකයකි.
(1) රඹුටන් (2) අඹ (3) දෝතලු

35. ඉරබටු තරුව, පහන් තරුව යන නම්වලින් හඳුන්වන ග්‍රහලෝකය වන්නේ,
(1) බ්‍රහස්පති (2) සිකුරු (3) අඟහරු

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

36. කොවිඩ් 19 රෝගයේ රෝග වාහකයා වන්නේ,
(1) මදුරුවා ය. (2) බල්ලා ය. (3) මිනිසා ය.

37. ධීවර කර්මාන්තයේ භාවිත කරන උපකරණයකි,
(1) කරක්ගෙඩිය (2) දිදාලය (3) වරක්කලය

38. ජල උල්පත් ආරක්ෂා කර දීමට විශාල වශයෙන් දායකත්වය ලබාදෙන ශාකයක් වන්නේ,
(1) දිවුල් (2) පොල් (3) කුඹුක්

39. අලුත් මාළු හඳුනාගත හැකි ක්‍රමයක් වේ.
(1) කරමල සුදු පාට වීම.
(2) ඇස් මලානික වීම.
(3) ඇඟිල්ලෙන් එබූ විට නැවත යථා තත්ත්වයට පත් වීම.

40. ආහාර අපිරිසිදු වන පාරිසරික නොවන හේතුවකි.
(1) රසායනික ද්‍රව්‍ය යෙදීම.
(2) වර්ෂාවට නිරාවරණය වීම.
(3) අධික හිරු රැසට නිරාවරණය වීම.

41. ආරක්ෂක ආහාර කාණ්ඩයට අයත් වන්නේ,
(1) බත් (2) මස් (3) පලා වර්ග

42. සිරුරට ගිනි ඇවිලුණු විට කළ යුතු දෙයකි,
(1) වේගයෙන් දිවීම.
(2) ආලේපන ගැල්වීම.
(3) තෙත ගෝණියක් පැදුරක් වැනි දෙයක් ඇඟ වටා ඔතාගෙන බිම පෙරළීම.

43. 1990 යන දුරකථන අංකය භාවිත කරනු ලබන ඒකකය වන්නේ,
(1) හදිසි ප්‍රතිකාර ඒකකය
(2) ළමා හා කාන්තා කාර්යාංශය
(3) රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය

44. කොරෝනා රෝගයෙන් ආරක්ෂා වීමට කළ යුතු දෙයක් නොවන්නේ,
(1) මුඛ ආවරණ පැළඳීම
(2) විෂබීජනායක දියර යොදා අත් පිරිසිදු කිරීම
(3) සංචරණ සීමා නොපිළිපැදීම

45. බොත්තම් කාසියක් මැසීමට සුදුසු මැහුම් ක්‍රමය වන්නේ,
(1) නැටි මැස්ම (2) බ්ලැන්කට් මැස්ම (3) කතිර මැස්ම


46. කුඹුරේ දිය හොල්මන සවි කළ හැකි ස්ථානයකි.
(1) ලියැද්ද (2) වක්කඩ (3) නියර


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


47. ශ්‍රී ලංකාවේ දූපත් රාශියක් පිහිටා ඇති ගංගාව වන්නේ,

(1) මහවැලි ගඟ (2) මාදු ගඟ (3) කළු ගඟ

48. පහත රූප අතරින් බල්බයක් දල්වා ගත හැකි අවස්ථාව ඇතුළත් රූප සටහන කුමක් ද?

(1) 


(2) 


(3) 


49. වගාවට පැමිණෙන සතුන් එලවීම සඳහා යොදා ගන්නා ක්‍රමයක් නොවන්නේ මින් කුමක් ද?

(1) දිය හොල්මන් යෙදීම (2) ගොක් රැහැන් එල්ලීම (3) කෘමිනාශක ඉසීම

50. බීජ යොදාගෙන කරනු ලබන ක්‍රීඩාවක් නොවන්නේ,

(1) ඔළිඳ (2) පොරපොල් ගැසීම (3) පංච දැමීම

51. ආක්‍රමණශීලී චර්යා මගින් අපට සිදුවන අවාසියකි,

(1) ගැටුම් ඇති වේ. (2) මිතුරන් වැඩි වේ. (3) සමගිය ඇති වේ.

52. පොකුරු කාණ්ඩයට අයත් මලකි.

(1) ඇන්තූරියම් (2) ගැටපිච්ච (3) අරලිය

53. අහිතකර කිරණින් අපව ආරක්ෂා කරන්නේ,

(1) ඕසෝන් ස්ථරය (2) ඝන වලාකුළු (3) වර්ෂාව

54. සන්නිවේදනයේ අංගයක් නොවේ,

(1) ලිපිය (2) යවන්නා (3) මාධ්‍යය


55. මෙම රූපය දැක්වෙන්නේ,

(1) මිහින්තලය

(2) සීගිරිය

(3) දඹුල්ල



56. 

මෙම උපකරණයෙන් සිදු කරන කාර්යය වන්නේ,

(1) බිත්තියේ සිරස් බව නිවැරදි දැයි පරීක්ෂා කිරීම.

(2) බිත්තියේ තිරස් බව නිවැරදි දැයි පරීක්ෂා කිරීම.

(3) බිත්තියේ උස මැන ගැනීම.

57. 

මෙම රූපයෙන් දැක්වෙන්නේ කවුරුන් ද?

(1) ආනන්ද කුමාරස්වාමි

(2) ටී. බී. ජයා මහතා

(3) ආතර් සී ක්ලාක් මහතා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

58. කතරගම ඓතිහාසික පුදබිම අසළින් ගලා යන ගංගාව වන්නේ,
(1) වලවේ ගඟ (2) මහවැලි ගඟ (3) මැණික් ගඟ

59. ලීයක කැටයමක් කපා ගැනීමට භාවිත කළ හැකි සුදුසු ම උපකරණය වන්නේ,
(1) බුරුමය (2) නියන (3) යතුකැටය

60. "යහපත් මිතුරන් ඇසුරු කිරීමේ අගය" යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

i. ..............................................................................................................

..............................................................................................................

ii. ..............................................................................................................

..............................................................................................................

iii. ..............................................................................................................

..............................................................................................................

* * * * *

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව අනුමාන පෙරහුරු පරීක්ෂණය

# වයඹ පළාත

පිළිතුරු පත්‍රය

## ප්‍රශ්න පත්‍ර අංකය - 01

### 1 පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. 3 | 2. 3 | 3. 1 | 4. 2 |
| 5. 2 | 6. 1 | 7. 3 | 8. 2 |
| 9. 1 | 10. 2 | 11. 2 | 12. 2 |
| 13. 3 | 14. 3 | 15. 1 | 16. 2 |
| 17. 3 | 18. 2 | 19. 3 | 20. 2 |
| 21. 1 | 22. 3 | 23. 2 | 24. 1 |
| 25. 3 | 26. 2 | 27. 1 | 28. 1 |
| 29. 1 | 30. 3 | 31. 3 | 32. 1 |
| 33. 3 | 34. 2 | 35. 1 | 36. 3 |
| 37. 3 | 38. 2 | 39. 1 | 40. 1 |

### 2 පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. 2 | 2. 1 | 3. 2 | 4. 1 |
| 5. 3 | 6. 1 | 7. 2 | 8. 2 |
| 9. 3 | 10. 1 | 11. 3 | 12. 2 |
| 13. 2 | 14. 2 | 15. 3 | 16. 1 |
| 17. 2 | 18. 3 | 19. 2 | 20. 2 |
| 21. 2 | 22. 3 | 23. 1 | 24. 3 |
| 25. 2 | 26. 2 | 27. 3 | 28. 1 |
| 29. 2 | 30. 3 | 31. 2 | 32. 2 |
| 33. 3 | 34. 2 | 35. 3 | 36. 3 |
| 37. 1 | 38. 1 | 39. 2 | 40. 3 |

### 3 පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. 2 | 2. 1 | 3. 1 | 4. 1 |
| 5. 3 | 6. 2 | 7. 2 | 8. 2 |
| 9. 2 | 10. 3 | 11. 2 | 12. 3 |
| 13. 1 | 14. 2 | 15. 3 | 16. 1 |
| 17. 3 | 18. 2 | 19. 1 | 20. 2 |
| 21. 3 | 22. 3 | 23. 2 | 24. 2 |
| 25. 1 | 26. 2 | 27. 2 | 28. 1 |
| 29. 2 | 30. 1 | 31. 3 | 32. 1 |
| 33. 2 | 34. 2 | 35. 3 | 36. 3 |
| 37. 3 | 38. 1 | 39. 3 | 40. 1 |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

4 පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. 2 | 2. 1 | 3. 3 | 4. 1 |
| 5. 3 | 6. 2 | 7. 3 | 8. 3 |
| 9. 1 | 10. 1 | 11. 2 | 12. 3 |
| 13. 2 | 14. 1 | 15. 2 | 16. 1 |
| 17. 3 | 18. 3 | 19. 2 | 20. 3 |
| 21. 3 | 22. 2 | 23. 2 | 24. 1 |
| 25. 3 | 26. 1 | 27. 2 | 28. 3 |
| 29. 2 | 30. 2 | 31. 1 | 32. 3 |
| 33. 2 | 34. 3 | 35. 1 | 36. 3 |
| 37. 3 | 38. 1 | 39. 3 | 40. 2 |

5 පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. 3 | 2. 2 | 3. 2 | 4. 1 |
| 5. 2 | 6. 2 | 7. 3 | 8. 1 |
| 9. 3 | 10. 1 | 11. 3 | 12. 2 |
| 13. 3 | 14. 2 | 15. 2 | 16. 1 |
| 17. 3 | 18. 3 | 19. 1 | 20. 2 |
| 21. 2 | 22. 3 | 23. 3 | 24. 1 |
| 25. 2 | 26. 3 | 27. 1 | 28. 2 |
| 29. 1 | 30. 3 | 31. 2 | 32. 3 |
| 33. 2 | 34. 3 | 35. 2 | 36. 3 |
| 37. 2 | 38. 3 | 39. 2 | 40. 1 |

## ප්‍රශ්න පත්‍ර අංකය - 02

1 පත්‍රය

01. i. වැඩිහිටියෝ ii. රාස්සි iii. රිංගූ iv. දැවැන්ත
v. රාස්සිගේ අච්ච vi. ගම දෙස බලා සිටින අද්භූත මිනිසෙකු වැන්න.

02. i. පීදෙයි ii. ආවා ය iii. කරති

03. i. "සීයේ, මම කියන්න ද?" බින්දු කීවේ ය.
ii. අපට ඒ කාලය සතුටින්, විනෝදයෙන්, සැහැල්ලුවෙන් ගත කරන්න පුළුවන්.

04. i. පරංගියා ii. ගෙම්බා

05. i. වනය ii. කාර්යශූර

06. i. මූණ කට සෝදා ගෙන
ii. අලසකම් දුරු කොට

07. i. කණ්ඩායම් ii. දොරවල්

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

08. i. මම පාඩම් කරමි. ii. කාන්තාවෝ මල් නෙළුවෝ ය. / නෙළූහ.

09. නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.


10. i. මුහුණ ii. වලාකුළු

11. i. Horse ii. Rainbow

12. i. How much is an orange? ii. I will come tomorrow

13. යහළුවා 14. ඔබේ පුටුව කුමක් ද?

15. i. 7 ii. 800 16.




17. i. 2 ii. 1

18. 3986 19. 4

20. 8*l* 825m*l*

21. i. ප.ව. 9.00 ii. 20:00

22. 886 23. i. $\frac{4}{10}$ / $\frac{2}{5}$ ii. 0.6

24. i. රු. 210.00 ii. තේ කොළ 25. 4323, 3994, 3826, 2452 26. vi

27. i. 240 ii. 60

28. i. රු. 180.00 ii. රු. 780.00

29. 4406 30. i. මිනිත්තු 45 ii. 14:30

| | | | | | |
|---|---|---|---|---|---|
| 31. 1 | 32. 2 | 33. 2 | 34. 3 | 35. 3 | 36. 2 |
| 37. 1 | 38. 2 | 39. 2 | 40. 3 | 41. 3 | 42. 2 |
| 43. 2 | 44. 2 | 45. 1 | 46. 2 | 47. 1 | 48. 3 |
| 49. 3 | 50. 3 | 51. 2 | 52. 2 | 53. 1 | 54. 2 |
| 55. 2 | 56. 3 | 57. 3 | 58. 1 | 59. 2 | 60. 3 |

## 2 පත්‍රය

01. i. එක් අතකින් මුහුදටත් අනෙක් අතින් විශාල නදියකටත් මැදිව පිහිටි නිසා

ii. බුරුල්ල/ කිරිල්ල/ ගඳපාන/ කහඹිලියා/ කිඩාරම්/ බලුනගුට අත්තන

iii. හාවුන්, ලේනුන්, සර්පයන්, මුගටියන්, උගුඩුව, වල් මීයන් iv. සුදු වැලි තලා ඇති වනරොද

v. බලුනගුට vi. කුඩා

02. i. අද කළ යුතු දේ හෙටට කල් නොදමන්න.

ii. නිර්මාණ පුවරුවේ ඇති දෑ කියවීමට පුරුදු වෙමු.

03. i. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ

ii. ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ

04. i. ඇඟ බේරා ගන්නවා ii. මුරුංගා අත්තේ තියනවා

05. i. විවාද ii. තහළු

06. i. ✗ ii. ✓ iii. ✗ iv. ✓ v. ✓

07. i. ගුරුවරිය 'අපේ ලංකාව' ගීතය ගායනා කළා ය.

ii. අනේ! අනේ! ඔහොම වැරදි වැඩ කරන්න හොඳ නැහැ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

08. i. මර්දනයට ii. මධ්‍යස්ථානයට

09. i. අයියා පොතක් කියවූවේ ය. ii. නංගී ලස්සන නැටුමක් නැටුවා ය.

10. i. brinjal ii. guava

11. මට ඇඟිලි දහයක් තියෙනවා.


12. i. How old are you? ii. I am hungry

13. i. බදාදා ii. පොළ

14. i. පෙන්සිල් ඉරුක්කිරදු

ii. එනදු තමිළ් පුත්තහම් එංගේ?

15.




16. i. 3 ii. 2

17. 46

18. රු. 20.00

19. 7l 575ml

20. i. 11.00 ii. 23:00

21. 18 375

22. i. $\frac{5}{10}$ / $\frac{1}{2}$ ii. 0.5


23. 96km

24. 2, 1

25. ix

26. 139

27. i. ඇපල් 18 ii.




28. පැය 1

29. 48m

| | | | | | |
|---|---|---|---|---|---|
| 30. 2 | 31. 2 | 32. 1 | 33. 1 | | |
| 34. 3 | 35. 2 | 36. 3 | 37. 1 | | |
| 38. 3 | 39. 3 | 40. 1 | 41. 3 | | |
| 42. 3 | 43. 1 | 44. 3 | 45. 2 | 46. 2 | 47. 2 |
| 48. 1 | 49. 3 | 50. 3 | 51. 1 | 52. 3 | 53. 1 |
| 54. 1 | 55. 2 | 56. 1 | 57. 3 | 58. 3 | 59. 2 |

60. නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

## 3 පත්‍රය

01. i. අප ii. ගුරුවරයා iii. පස්වන ශ්‍රේණිය

iv. ප්‍රභාවි කලාකවය v. චිත්‍ර/ අත්කම්/ කවි/ ගීත/ කතන්දර

vi. පන්තිභාර ගුරුවරයා

02. i. කසළ කළමනාකරණය ii. පෘථිවියේ

03. i. ඌ ii. ඔහු iii. ඔවුහු

04. i. රාත්‍රිය ii. රෝගය

05. කිරිහාමි, ඔබට පිස්සු ද? නැගිටිනවා, නැගිටිනවා.

06. i. යමක් කිරීමට පෙර සිතා බලන්න.

ii. ප්‍රමාණයට වඩා අහංකාර නොවන්න.

07. i. නරියා මිදි තිත්තයි කිවුවා වගේ

ii. රයිගමයයි ගම්පළයයි වගේ

08. i. අම්මා පොළට යයි.

ii. මම අඩු මුදලකින් පහනක් ගත්තෙමි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

09. ඉටුකොට කළ යුතු යුතුකම්/ ඉවසන්නට පුළුවන්නම්

10. i. දරුවන් ii. මං 11. i. මුහුදු වෙරළ ii. සුළඟ

12. i. Comb ii. chair

13. i. I like story books ii. I have two sisters

14. කාහම් කරුප්පු තිරම්

15. i. ඔයාට වතුර ඕනෙ ද? ii. බෝලෙ දෙන්න.

16. තිස් දහස් පන්සිය හැත්තෑ තුන 17. 800

18. i. 3 ii. 5/ 7

19. 20*l* 250m*l* 20. 297km 21. 15kg 250g

22. i. 15:40 ii. පැය 5 මිනි 30 23. viii

24. i. චතුස්තලය ii. 10 25. 0.5

26. 40

27. i. 65.00 ii. 750g iii. රු. 1400.00 iv. රු. 2365.00

28. රු. 45.00

29. i. මල් 15 ක් ලකුණු කර තිබිය යුතු ය. ii. 130

30. නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 31. 3 | 32. 2 | 33. 2 | 34. 3 | 35. 2 | 36. 3 |
| 37. 2 | 38. 3 | 39. 2 | 40. 2 | 41. 2 | 42. 3 |
| 43. 2 | 44. 2 | 45. 1 | 46. 2 | 47. 2 | 48. 2 |
| 49. 1 | 50. 3 | 51. 3 | 52. 1 | 53. 3 | 54. 3 |
| 55. 2 | 56. 2 | 57. 2 | 58. 2 | 59. 3 | 60. 2 |

## 4 පත්‍රය

01. i. දිය ඇල්ල ii. පහළට
iii. රත්තණ පඳුරක් අස්සෙන් iv. රූරා v. ඇළක් බවට පත් වේ.
vi. යයි vii. දිය viii. ගම මැදින්

02. i. කොම්බුව හා ගයනුකිත්ත ii. රකාරාංශය

03. (ii) 04. වසර

05. ඔරුව දූපතේ දකුණු පැත්තට ළඟා විය.

06. i. ණ ii. ළ

07. සේවකයා වෙහෙස වී වැඩ කළේ ය.

08. i. අහල පහල ii. වතුපිටි

09. i. ගෙවිලිය ii. ගොයම් iii. කැපුවා ය.

10. i. ක්‍රීඩිකාව ii. මුවදෙන

11. නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

12. i. Ice-Cream ii. Pumpkin

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

13. මගේ පැන්සල කොහෙ ද?

14. i. පූනෙ ii. මාම්පළම් iii. ඔයාගේ පන්තිය කොහේ ද?


15. i. 65432 ii. 4

16. i. 8800 ii. 6009 17. 105, 168

18. i. $\frac{1}{4}$ ii. $\frac{6}{10}$ / $\frac{3}{5}$

19. i. සිලින්ඩරය ii. 3 20. i. 34 ii. 141

21. 13kg 750g 22. i. 11m 35cm ii. 2m 15cm

23. ප.ව. 3.50 24. i.  ii. 14:30

25. i. රු. 165.00 ii. 11

26. i. 2450 ii. 604

27. 01 28. 3/ 5/ 9

29. xii 30. රුපියල් 175.00

| | | | | | |
|---|---|---|---|---|---|
| 31. 2 | 32. 1 | 33. 3 | 34. 3 | 35. 3 | 36. 2 |
| 37. 1 | 38. 3 | 39. 1 | 40. 2 | 41. 2 | 42. 3 |
| 43. 1 | 44. 1 | 45. 3 | 46. 3 | 47. 2 | 48. 2 |
| 49. 3 | 50. 3 | 51. 2 | 52. 1 | 53. 2 | 54. 3 |
| 55. 1 | 56. 1 | 57. 2 | 58. 2 | 59. 1 | 60. 3 |

**5 පත්‍රය**

01. i. යාළුවෝ හතර දෙනාගේ සැප දුක් දැනගන්න. ii. ඇපල් ගෙඩියක්
iii. පහයි iv. එදා රෝද ගෙන යන කොට හිනා වෙච්ච නිසා
v. රුං vi. රුං vii. හඬලන
viii. ඉදිකටු මුදියන්සේ ඇපල් ගෙඩියක් දෙයි.

02. i. බැලුවේ ය. ii. තැබුවෝ ය. iii. කළේ ය.

03. i. සහනාධාරයක් ii. කණිෂ්ඨ iii. අභ්‍යවකාශ

04. අදූරදර්ශී උපදෙස් දීම.

05. i. සෙල්ලම් ii. දොරවල්

06. මඳ සුළඟයි මේ එන්නේ

07. කුඩා හොරා, මැටි ගෙදර ළමයි, සූස්තර පුංචා ඇගේ පොත් අතුරෙන් කිහිපයකි.

08. i. වෛද්‍යවරිය ii. දැරිය

09. ඒවා අතීතයේ සිට පැවත එයි.

10. නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

11. i. Clock ii. bottle

12. මම වැඩ කරන්නේ කුඹුරේ

13. That is a long train

14. i. ඇඟිල්ල ii. පුටුව

Sri Lanka's Largest Past Paper Bank — iskolee.com

15. උළ්ළේ වාරුංගළ්

16. 572     17. 53 275



18. 100     19. 3000

20. i. 6     ii. 299

21. රු 75.00     22. i. 144     ii. 0.4

23. i. 10     ii. 5

24. A. 65     B. 500g     C. 2500.00     D. 2965.00

25. i.  ii. 

26. 9

27. අමල්, අජිත්, නිමල්, කමල්     28. 20:50

29. A. 6     B. 6     C. 8     D. 2

30. 12cm

| | | | | | |
|---|---|---|---|---|---|
| 31. 3 | 32. 2 | 33. 1 | 34. 2 | 35. 2 | 36. 3 |
| 37. 1 | 38. 3 | 39. 2 | 40. 1 | 41. 2 | 42. 2 |
| 43. 2 | 44. 3 | 45. 2 | 46. 3 | 47. 3 | 48. 2 |
| 49. 3 | 50. 1 | 51. 1 | 52. 3 | 53. 3 | 54. 2 |
| 55. 1 | 56. 2 | 57. 3 | 58. 1 | 59. 3 | 60. 2 |